දැන සිටි නිසාද? කැටයම්කරුවකු විසින් වාත්තු කළාක් බඳු ඔහු කවුද? පින්තූරයේ සිටි ක්‍රිෂ්ණා වෙනුවට, ඔහු බටනලාව පිඹිනු බලා ගැනිමට රිදීමා අසීරු ප්‍රයත්නයක යෙදුණාය.

කවුදෝ දෙරට තඩි බෑවේ ඒ අතරය.

"රිදී... අනෙක් අය එන්න කලින් ඉක්මණයට නාගන්න. නැත්නම් හොට් වෝටර් ටික ඉවරවෙයි."

තරුණියන් නාගෙන පහළට එද්දී වැස්ස තුරල් කොට තිබුණේය. රිදීමා තම දිගු වරළස සෝද, එය මුදහැර උන්නාය. ඇගේ මුදුව ඇඳ හැලුනු කෙස් කළඹත්, හදවතක හැඩය ගත් මුහුණත්, කුඩා නැහැයත්, රෝස කැකුළක් බඳු මුව පොඩියත් අතිශයින් සුන්දර වුයේය. ඇය වෙතින් දිස් වුයේ ළදරුවකුගේ බඳු අවිහිංසක බවකි. ඇය දුටු ඕනෑම අයකු ඇය වෙත ඇදුණේ ආදරයෙනි. ඊර්ෂ්‍යාවකින් හෝ ද්වේෂයකින් නොවේ. රිදීමාට වඩා සම්පූර්ණයෙන් වෙනස් වු මහීකා උසට ගැලපෙන මහතකින් යුත් තරුණියක් වුවාය. ඇයට වුයේ විසල් දෑසක්, දිගු නැහැයක් හා පළල් මුවකුත්ය. උරහිස දක්වා වු ඇගේ කෙස් කළඹ ඝනව වැඩී තිබුණේය.

රුචිරාද, අමාද තෙමීගෙනම ගෙට ගොඩවුනා.

"ජරා වැස්ස... " ඉතා සිහින් සිරුරක්, කෙටිම කෙටි කෙස් කළඹක් , හා දිගටි මුහුණක් සහිත තරුණියක වු අමා පැවසුවාය. "ඇඳුම් මාරු කරගෙනම ඇවිත් තේ බොමු... "

වටකුරු මුහුණක් හා එබඳුම දේහයිකින් හෙබි රුචිරා ද වහා උඩුමහලට දිව ගියාය.

"අපි තේත් හදලා, රෑට මොනවා හරි උයන්නත් ලෑස්ති කරමු ... " මහීකා පැවසුවාය. නිවසේ කෑම වට්ටෝරු සැදුණේ ඇය අතිනි. වට්ටෝරු මාරු කරමින් බර අඩුකර ගැනීමට තැනුවේ රුචිරාය. එහෙත් කුමන වට්ටෝරුවක් අනුව කෑම, බීම පාවිච්චි කළත්, ඇගේ බර අඩුවන බවක්ද නොපෙනුණේය.

"අපි කුකුල් මස් කරියක් හදලා, අල ටිකක් සැරට තෙල් දමු... " රිදීමා හිස වනා මහීකාගේ අදහස අනුමත කළාය. ඔවුන් පාවිච්චි කළේ ශ්‍රී ලංකාවෙන් ගෙනා කුළුබඩු

***<u>සිත සන්සුන් කිරීමට තැත් කළත්, ඇයට මෙනෙහිවුයේ ඔහුගේ සරදම් සිනාවය. ප්‍රශ්ණාර්ථයෙන් යුත් තියුණු බැල්මය. ඉන් ඔහු තමාට දීමට තැත් කළ පණිවුඩය කුමක්ද? මහීකා පවන්නාක් මෙන් ඇය තුළ බිහිව ඇත්තේ ඔහුගේ කඩවසම් බව දකීමෙන් හටගත් හැඟීමක් නම් නොවේ. එසේ නම් ඒ හැඟීම කුමක්ද?</u>***

නිසා නිවසේදී මෙන්ම රසවත් කෑම වේලක් මෙහිදී ද ලැබුණේය. ආහාරවලට යන මුදල ඔවුහු බෙදා ගත්තෝය.

රිදීමා හීනියට ලොකු ළූණු කපා, අල තම්බන තුරු මහීකා තේ සෑදුවාය. කුකුළා කැපුවේ අමාය. ඉතා සිහින් ඇයට එබඳු ශක්තියක් ඇත්තේ කෙසේදැයි සිතනා තරම් වැරෙන් ඈ කුකුළාට පහර දුන්නේය.

"අනේ පව් මැරිලා හිටියේ නැත්නම් අසරණයා ඔය පාරවලට අනිවාර්යයෙන්ම මැරෙන්වා... රුචිරා පැවසුවාය.

"බලාගෙන ... " මහීකා අවවාද කළාය. පිහිය තියෙන්නේ අමා අතේ .. " ඇය පැවසුවේ අමාද සිනස්සමිනි. කෑම ඉදෙනා තුරු ඔවුහු මේසය වටා හිඳගෙන තේ පානය කළහ. අමා නගරයේ සුප්‍රසිද්ධ විශ්ව විද්‍යාලයක ශිෂ්‍යවක වු අතර, රුචිරාගේ අධ්‍යාපන පිඨය වුයේ නිවසට නොදුරුවමය. උදෑසන ඒ දෙදෙනා එකට නික්මුණාහ. රුචිරා මුලින්ම බස්සවන අමා, තම කාරය දුම්රියපොළෙහි දමා, දුම්රියෙන් නගරයට ගියාය. සවසටද මේ දෙදෙනා බොහෝ විට නිවසට එකට ආවෝය.

යෙහෙළියෝ මාතෘකාවෙන් මාතෘකාවට පහසුවෙන් මාරු වුහ. නුතන විශ්ව විද්‍යාලයීය සිසු සිසුවියන්ගේ මෝස්තර (මීට ඇඳුම්, පැළඳුම් සහ කොණ්ඩා යන සියල්ල අයත් විය) විවිධ දේශකයින්, ඔවුන්ගේ



දේශණ, සිංහල සිසු, සිසුවියන්ගේ හැසිරීම, ඕස්ට්‍රේලියානු අධ්‍යාපන ක්‍රමය වැනි ඕනෑම තරම් මාතෘකා ඔවුන්ට කථා කිරීමට තිබුණේය.

මහීකාට හවස වු සිද්ධිය මතක් වුයේ මේ අතරතුරය.
"අද රිදීමාට මරු වැඩක් උණානේ. .. " කියමිනි, ඇය කථාව ආරම්භ කලේ

"ඒ මොකද්ද ? " ඕපාදුව ඇසීමට කොහෙ-ාමත් කැමැත්තක් දක්වන රුචිරා ඇසුවේ කුහුලෙනි.
"එයා හැන්ඩ්සම් බෝයි කෙනෙක්ව දැක්කා .... මහීකා ලතාවකට කීවාය.

"රිදීමා එයාව හොඳට දන්නවලු.. හැබැයි මුණ ගැහුණේ කොහේදිද කියලා මතක නැතිලු ...' "

හැමෝම හඬනඟා සිනාසුනේය. "ඕකට කියන්නේ දවල් හීන දකිනවා' කියලා ... "
සිනහව නතර වු පසු අමා පැවසුවාය.
එහෙම සිද්ධියක් මගේ ජීවිතේටවත් අහලා නෑ ...
රිදිමාට දැනුණේ මහත් අපහසුවකි.
මමත් එහෙම දෙයක් කවදවක් අහලා නැහැ.... ඒත් මම එයාව හොඳටම දන්නවා. මට ඒක හොඳටම විශ්වාසයි. ... ඉන් එහා මට මුකුත් හිතාගන්න බැහැ.
"ඔන්න ... ඔන්න... රුචිරා ඇයට බාධා කළාය. "මේ පුනරුප්පත්ති කථා නම් බැහැ හොඳේ. මම ඔය මනස්ගාත විශ්වාස කරන්නෙ නැහැ."

"ඉංජිනේරුවෝ මොනවද විශ්වාස කරන්නේ ? " ඒ අමාය. ඒ ගෝල්ලෝ දන්නේ ඉලක්කම් විතරනේ...
ඔවුන්ගේ සිනහව යළි අළුත් වුයේය.

"පොඩ්ඩක් විපරම් කලා බලන්න. කරාබු දපු, කොණ්ඩේ වවපු අය ඔයාලගේ යුනිවර්සිටයි එකේ මහගොඩක් ඇති කියලා මට නම් හිතෙන්නේ නැහැ... " අමා යළිත් කීවාය.
"දාන්නකෝ පත්තරේට ආටිකල් එකක්. ඔය දෙන්නම පුරුදු වෙන්නේ ජර්නලිස්ට්ලා වෙන්න නේද? රුචිරා ඇසුවාය.
අපෝයි ඔව් ඔයාලා වගේ අයගේ හොර අල්ලන්න තමයි අපි පුරුදු වෙන්නේ ...

මහීකා වහා පිලිතුරු දුන්නාය.
විහිළු තහළු මැද රෑ කෑම ගත්තද, රිදීමාගේ සිත තුළ වූයේ එළියට ඒමට තැත් දරන කුමක්දෝ හැඟීමකි. ඒ හැඟීමට ඉස්මතු වීමට ඈ ඉඩ නුදුන්නාය.

කලින්ම ඇදට වැටුණද, ඇයට නින්ද නො-ආවේය. ඇගේ ඔස්ට්‍රේලියානු ගමනට දෙමව්පියෝ තදින්ම විරුද්ධ වූහ. ටික කලකට හෝ ඇය මෙහි එවිය යුතු යැයි තීරණය කළේ වෛද්‍ය සිසුවකුව නදීන් අය්යාය. අමා ඔහුගේ හිතවතියකි. එකම පාසැලේ උගත් රුචිරා සහ මහීකාද එකම නවාතැනක සිටීම තවත් සහනයක් වුයේය.

දෙමව්පියන් හා සොහොයුරාත් හැර ගෙදර වාසය කළ අන් අය වුයේ මුළුතැන්ගෙහි වැඩපළ කළ සුබරත්න මැණිකේත්, අතුපතුගෑම් වැනි පුංචි පුංචි වැඩකළ පිංචි කෙල්ලත්, වත්ත පිටිය උදලු ගෑ හීන්බණ්ඩේත්ය. ඔවුහු සියල්ල 'සුදු බේබි' යන හුරතල් නාමයෙ-න් රිදීමා ඇමතුහ. තමාට කිසිවකු 'සුදු මැණිකේ .. " යනුවෙන් අමතන මතකයක් රිදීමාට නොවීය.

පාසැලේදී ඈ ඉතා දීප්තිමත් ශිෂ්‍යාවක් වුවාය. දක්ෂ ක්‍රීඩිකාවක, චතුර කථිකාවක වුවාය. එහෙත් තමා සිතූ තරම් ඉහළින් විශ්ව විද්‍යාලයට යෑමට සුදුසු ලකුණු මට්ටමක් ඇයට ලබාගත් නොහැකි වුයේය. එහෙත් ලිවීමට ඇය තුළ වු ආශාව දන්නා සොහොයුරාගේ බලපෑමෙනි, ඇය මෙහි පැමිණියේ. නදීන් අයියා මෙනෙහි වීමෙන් රිදීමාට පාළුවක් ද දුකක්ද දැනුණේය. ඔහු ළඟ හිඳිද්දී ඇයට දැනුණේ, ඇගේ ලොව සුරක්ෂිත බවකි. ජීවිතය ගෙන යෑමේ බලවත් ශක්තියකි. තම දෙව්පියන් ජීවත්ව සිටිද්දී තමාගේ ආරක්ෂාවට සොහො-යුරා අවශ්‍ය මන්දැයි ඈ 'ඊළඟට කල්පනා කළාය. ඇයට දැනුණේ තමා කුමක් හෝ තාමත් සොයන බවකි. තමා ඒ සොයනා දෙය තම ජීවිතයට බාධාවක් බවය. එහෙත් ඒ කුමක්දැයි ඈ නොදත්තාය. තමාවත් කවුරුන් හෝ එසේ සොයන්නේද? ඇයට යළිදු සිහිවුයේ අර තරුණයාය. ඔහු දැකීමෙන් ඇය තුළ පහළව ඇත්තේ දැඩි කැළඹීමක් නොවේද? සිත සන්සු-න් කිරීමට තැත් කළත්, ඇයට මෙනෙහිවුයේ ඔහුගේ සරදම් සිනා-වය. ප්‍රශ්ණාර්ථයෙන් යුත් තියුණු බැල්මය. ඉන් ඔහු තමාට දීමට තැත් කළ පණිවුඩය කුමක්ද? මහීකා පවන්නාක් මෙන් ඇය තුළ බිහිව ඇත්තේ ඔහුගේ කඩවසම් බව දැකීමෙන් හටගත් හැඟීමක් නම් නොවේ. එසේ නම් ඒ හැඟීම කුමක්ද?

නින්ද ඇය ළඟට තුරුල්වු වේලාව රිදීමා නොදත්තාය.

හවස දුටු සැර ජල පහර වෙනුවට නිසලව ගලන දියදහරක් ඇය එවර දුටුවාය. ගඟදිය අසල තුරු සෙවනක හිඳ ක්‍රිෂ්ණා, සිය බටනලාව වැයීය. තමාගේ ශක්තිමත් බාහු යුග්මයෙන් රිදීමා සිය ග්‍රහණයට අසුකර ගත් තරුණයා, ගඟ පහළට ඇයද රැගෙන පිහිනීය. ඔහුගේ තෙත් වු දිගු කෙස් කළඹ සිහට ඇලී තිබි අතර, කනෙහි වු කරාබු දියබිඳු වැටී වඩාත් දිළිසුනේය.

වතුර ගලායන ස්වරය හා බටනලා වාදනයද එක්ම නැගුනු මිහිරි සංගීතයට සවන් දෙමින් රිදීමා දිගටම නිද ගත්තාය.

මතු සම්බන්ධයි

**මහමෙව්නාව අසපුවෙන් මෙල්බර්න් නගරයට**
**මාසික දහම් වැඩ සටහන් මාලාවක්**

සිඩ්නි මහමෙව්නා භාවනා අසපුව මගින් මෙල්බර්න් පුරවරයේදී මාසික සීල භාවනා වැඩ සටහන් පැවැත්වීමට කටයුතු යොදා ඇත- අති පූජනීය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේගේ ශිෂ්‍ය සිඩ්නි මහමෙව්නා භාවනා අසපුවෙහි වැඩ වසන පින්වත් ස්වාමීන් වහන්සේ විසින් සෑම මසකම හතරවන සති අන්තයේදී උතුම් තථාගත ශ්‍රී සද්ධර්මය සැදැහැවතුනට තව දුරටත් දායාද කරමින් ගෞතම බුද්ධ ශාසනය ඉස්මතු කරලීමේ හා පතුරුවා හැරීමේ වැදගත්කම සූත්‍ර දේශනා ඇසුරින් පැහැදිලි කරමින් සීල සමාධි ප්‍රඥා දියුණු කිරීමට අනුබල දීම සඳහා මෙම දහම් වැඩ සටහන පවත්වනු ලැබේ- ඒ අනුව මීළඟ සීල භාවනා වැඩ සටහන මාර්තු මස 27 වන සෙනසුරාදා උදේ 8:30 සිට සවස 4:30 දක්වා ග්ලෙන්වේවලි ප්‍රජා ශාලාවේදී (Glen Waverley Community Hall, 700 Waverley Rd., Glen Waverley) පවත්වනු ලැබේ-
භාවනා- ධර්ම දේශනා- මෙන්ම ධර්ම සාකච්ඡාද මෙම දහම් වැඩ සටහනට ඇතුළත් වේ- සහභාගී වන සැදැහැවතුන් හට දහවල් දානය සපයනු ලබන අතර දාන කටයුතු වලට සහභාගී විය හැකි අය කරුණාකර අමතන්න:

සුනන්දා තිලකරත්න 8772 5237

ගෞතම බුදුරජාණන් වහන්සේ අපගේ ජීවිත අවබෝධය පිණිස දේශනා කර වදාළ උතුම් ශ්‍රී සද්ධර්මය ඇතුළත් සූත්‍ර දේශනා රාශියක් අඩංගු මහමෙව්නාවේ බොහෝ සදහම් ප්‍රකාශන සහ සදහම් පට මිලදී ගැනීමේ දුර්ලභ අවස්ථාවද ඔබට මෙහිදී හිමි කර ගත හැක-

**සුනන්දා තිලකරත්න - සංස්කාරක - සදහම් හිරු කිරණ 03 8772 5237**